00024

# ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය

## රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ප්‍රජාතන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යාංශය

## ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය (2015 /1)

## ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය හා පරිපාලන නීතිය (01-I)

කාලය පැය 03 යි.

**ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.**

---

01 අ). 1947 ලංකා ස්වාධිනතා පනතෙන් බිහි වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව (සෝල්බරි ව්‍යවස්ථාව) අනම්‍ය ව්‍යවස්ථාවක් ලෙස හැඳින්වීම කෙතෙක් දුරට යුක්ති සහගත ද? (ලකුණු 10)

ආ). එකී ආණ්ඩුක්‍රමය ක්‍රියාත්මක වූ කාලයේ ව්‍යවස්ථාදායක, විධායක සහ අධිකරණ බලතල බෙදී ගොස් තිබුණු ආකාරය පැහැදිළි කරන්න. (ලකුණු 10)

02 මෙරට විධායක ජනාධිපති ධුරයේ බලතල සහ කාර්යභාරය මෑත කාලයේ දී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ගෙන එනු ලැබූ සංශෝධන මගින් වරින් වර වෙනස් වූ ආකාරයන් විභාග කරන්න. (ලකුණු 20)

03 අමාත්‍යාංශ ලේකම්වරුන් සම්බන්ධයෙන් වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යයවස්ථාවේ ඇතුලත් කොට ඇති ප්‍රතිපාදන සාකච්ඡා කරන්න. (ලකුණු 20)

04 අ). අභිනියෝජන ව්‍යවස්ථා (delegated legislations) යනුවෙන් කුමක් අදහස් කෙරෙන්නේ ද? නිදසුන් දෙමින් සාකච්ඡා කරන්න. (ලකුණු 05)

ආ). ඒවා ප්‍රධාන ව්‍යවස්ථා වලින් වෙනස් වන්නේ කෙ සේ ද? (ලකුණු 05)

ඇ). අභිනියෝජන ව්‍යවස්ථා වර්ග <u>දෙකක්</u> තෝරා ගෙන ඒවා කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 10)

05 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන හරහා රට තුල විවිධ විශේෂ කාර්යයන් සඳහා ස්වාධීන කොමිෂන් සභා පිහිටුවීම විවේචනාත්මකව අගයන්න. (ලකුණු 20)

06 අ). වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සහතික කර ඇති මූලික අයිතිවාසිකම් මොනවාදැ යි සාකච්ඡා කරන්න. (ලකුණු 10)

ආ). පුරවැසියන්ට ඒවා බුක්ති විඳිය හැක්කේ කවර සීමාවන්ට යටත් ව ද? (ලකුණු 10)

07 පරිපාලන අධිකාරීන්ගේ තීරණ ගැනීමේ ක්‍රියාවලියේ දී ස්වභාවික යුක්ති මූලධර්ම (Principles of Natural Justice) පිළිපැදීමේ ඇති වැදගත් කම නිදසුන් දෙමින් පැහැදිළි කරන්න. (ලකුණු 20)

********************